19.07.2023

# ද මැසිනොද් විදුහල, කඳාන
# De Mazenod College, Kandana

## කතෝලික ධර්මය

පළමු වාර පරීක්ෂණය-2023 | 08 ශ්‍රේණිය | කාලය පැය 2

Learning Resource Center R De Mazenod College Kandana

- අංක 1 සිට 10 දක්වා එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) ලූක්තුමා කුමන ජාතියකට අයත් වූවෙක්ද ?
   1. ග්‍රීක
   2. ග්‍රීන්ලන්ත
   3. රෝම
   4. ගිනියා

2) ලූක්තුමා පාවුළුතුමා සමඟ සහභාගිවූ ධර්මදූත චාරිකාවක් වන්නේ,
   1. 2 සහ 3
   2. 3 සහ 4
   3. 1 සහ 2
   4. 1 සහ 3

3) ලූක්තුමා ක්‍රිස්තුත් වහන්සේගේ පෙළපත. ආරම්භ කරේ,
   1. ආදම්ගෙනි
   2. මෝසෙස්ගෙනි
   3. ආබ්‍රහම්ගෙනි
   4. දාවිත්ගෙනි

4) ක්‍රිස්තුස් වහන්සේ තම ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කලේ.
   1. ගලිලයෙනි
   2. ජෙරිකෝවෙනි
   3. ජෙරුසලමෙනි
   4. නාසරතයෙනි

5) උත්ථානවූ ජේසුස් වහන්සේට ශ්‍රාවකයන් දෙදෙනෙකු මුණ ගැසෙන්නේ කුමන නගරයකට ඔවුන් යමින් සිටියදීද ?
   1. එම්මාවුස්
   2. සමාරිය
   3. ගෙරසේනිය
   4. හෙබ්‍රොන්

6) " යමෙකුගෙන් අයුතු ලෙස යමක් ගෙන තිබේ නම් ඔවුහු සතර ගුණයක් ආපසු දෙමි " මෙම ප්‍රකාශය කවුරුන් විසින් කා හට පවසන ලද්දේද ?
   1. ක්‍රිස්තුස් වහන්සේ විසින් සකේවුස්ට
   2. කසේවුස් විසින් මිම්යෙන් තුමාට
   3. සකේවුස් විසින් ක්‍රිස්තුස් වහන්සේට
   4. සකේවුස් විසින් පාවුළු තුමාට

7) එළිසබෙත්තුම්ය අන්නා දිවැසිවරිය මාර්තා - මරියා යන චරිත හා සම්බන්ධ වන්නේ,
   1. දයාවේ ශුභාරංචිය
   2. යාච්ඤාවේ ශුභාරංචිය
   3. කාන්තාවන්ගේ ශුභාරංචිය
   4. කොන්වූවන්ගේ ශුභාරංචිය

8) " තියෝපිලස් " යන වචනයේ අර්ථය වන්නේ,
   1. උසස් නිලධාරියා
   2. ශු. ලූක්තුමා
   3. දේව සේවකයා
   4. දෙවියන් වහන්සේගේ මිතුරා

9) යාච්ඤාවේ ශුභාරංචිය හා නොගැළපෙන ප්‍රකාශය වන්නේ,
   1. අපෝස්තුළුවරු තෝරා ගැනීමට පෙර ක්‍රිස්තුස් වහන්සේ යාච්ඤා කළේය.
   2. ක්‍රිස්තුස් වහන්සේ බෞතිස්මය ලබා යාච්ඤා කළේය.
   3. ජේසුස් වහනසේගේ උපත සියලු ජනයාට ආනන්ද ජනක පුවත්ක බව
   4. ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ට යාච්ඤා කරන සැටි කියා දුන්නේය.

10) ජේසුස් වහනසේ කොටළුවකු පිට නැගී ජේරුසලමට ගියේ,
   1. පාස්කු ඉරුදින
   2. මහ සිකුරාදා
   3. ගොබ් ඉරුදින
   4. අළු බදාදා

11 සිට 15 දක්වා ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

11) ආබ්‍රහම්තුමා පොරොන්දු දේශයට රැගෙන ගිය දේවල් 3ක් ලියන්න.
12) ලූක් ශුභාරංචිය රචනා කිරීමේ මූලික පරාමාර්ථය කුමක්ද ?
13) දස පණතේ පස්වන පණත ලියන්න.
14) ක්‍රිස්තුස් වහන්සේ පාළුකරයේ දින 40ක් සිටිමින් කළ දේවල් 2ක් ලියන්න.
15) ජේසුස් වහන්සේ ජේරුසලමේ කළ සේවාවන් 2ක් ලියන්න.

පහත සඳහන් ප්‍රකාශ වල හරි වැරදි ලකුණු කරන්න.

16) ලූක්තුමා පාවුළු තුමා සමග ධර්මදූත චාරිකාවලට සහභාගි වූ බව නික්මයාම පොතේ සඳහන්වේ( )
17) සාවුල් රජතුමා ඉශ්‍රායෙල් ජාතියේ ශ්‍රේෂ්ඨතම රජතුමාය ( )
18) ක්‍රිස්තුස් වහන්සේව සකේවුස් මුණ ගැසුනේ ජේරුසලමේදීය ( )
19) යහපත් සමරිතානුවරයාගේ උපමාවෙන් අගය කරන සමරිතානුවරයන්ය ( )
20) ජුදා සමාජයේ අයකැමියන් පව්කාරයන් ලෙස සලකීය ( )

## II කොටස

පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

1) ලූක් ශුභාරංචිය ඇසුරෙන් කරන ලද ක්‍රියාකාරකම් හා පදනම් කරගෙන පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. ශු. ලූක්තුමා පිළිබඳ ඔබ කළ ක්‍රියාකාරකම කුමක්ද ? ල.2
ii. ශු. ලූක්තුමා පිළිබඳව ඔබ කරුණු සොයා ගත් ආකාර 3ක් ලියන්න. ල.3
iii. ශු.ලූක් ශුභාරංචියේ සඳහන් තුති පැසසුම් ගී 3ක් නම් කරන්න. ල.3
iv. ශු. ලූක් ශුභාරංචිය කියවීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන 4ක් ලියන්න ල.4
v. යහපත් සමරිතානුවරයාගේ උපමාවෙන් ඔබගේ ජීවිතයට ලැබෙන පණිවුඩ 4ක් ලියන්න ල. 4

2)

i. ලූක් ශුභාරංචියේ පණිවුඩ ලියා ඒවායින් ඔබගේ ජීවිතය ගොඩනගා ගැනීමට ලැබෙන මඟ පෙන්වීම් දෙන බැගින් ලියන්න. ල.5
ii. ලූක්තුමාගේ ජීවිතයෙන් ඔබට ලබාගත හැකි ආදර්ශ 5ක් ලියන්න. ල.6

3)

i. ලූක් ශුභාරංචියේ සැලැස්ම ලියා දක්වන්න. ල.5
ii. ඔබට පැවරෙන ඕනෑම කාර්යයක් සැලැස්මකට අනුව කිරීමෙන් අත්කර ගත හැකි වාසි 6ක් ලියන්න ල.6

4)

i. මෙසියස් වහන්සේගේ පැමිණිම සම්බන්ධ අනාවැකි ඉදිරිපත් කළ දිවැසිවරු දෙදෙනෙකු නම් කර ඔවුන් ඉදිරිපත් කළ අනාවැකිය බැගින් ලියන්න. ල.5
ii. දේව සැලැස්මට අනුගාමී වීමට ඔබට කළ හැකි දේවල් පහක් ලියන්න. ල.6

5)

i. ස්නාවක ජොහාන්තුමා අවවාද කළ ජන කණ්ඩායම් 3ක් නම් කර ඔවුන්ට ලබා දුන් උපදේශය බැගින් ලියන්න. ල.5
ii. ස්නාවක ජොහාන් තුමාගේ ජීවිතයෙන් ඔබට ලබා ගත හැකි ආදර්ශ 5ක් ලියන්න. ල.6

6)

i. සෙකරියස් තුමාට දේව දූතයා ලබා දුන් පණිවුඩය ලියන්න. ල.5
ii. ක්‍රිස්තුස් වහන්සේට වචනයෙන් මෙන්ම ක්‍රියාවෙන් සමීප වීමට ඔබට කළ හැකි දේවල් 6ක් ලියන්න ල.6

7)

i. නැතිවූ බැටළුවා පිළිබඳ උපමාව ලියා දක්වන්න. ල.5
ii. නොමගට යන මිතුරකු යහ මාර්ගයට ගැනීමට ඔබ ක්‍රියාකරන ආකාර 6ක් ලියන්න ල.6